# ගුරු අත් පොතට වැඩ පොත 01

L 1, S 1 නිපුණතා ආවරණය

# 2 ශ්‍රේණිය සිංහල



- ✓ පවසන දෙයට සවන් දීම
- ✓ පින්තූර බලා පවසන දෙයට සවන් දීම
- ✓ නිදහසේ කතා කිරීම
- ✓ පින්තූර බලා කතා කිරීම


සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



Face Book 3in1 Youtube 3in1 Online Class
Details WhatsApp 071-9020298

# 2 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_1$ $S_1$ ඉගෙනුම් පල

- ✓ පවසන දෙයට සවන් දීම
- ✓ පින්තූර බලා පවසන දෙයට සවන් දීම
- ✓ නිදහසේ කතා කිරීම
- ✓ පින්තූර බලා කතා කිරීම

- අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.
- පවසන දේ පිළිබඳ අවබෝධයෙන් යුතු ව සවන් දී ක්‍රියා කරයි.
- අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි.

## පවසන දෙයකට සවන් දීම

- පහත සඳහන් ඡේදයට සවන් දී ඡේදය ඇසුරෙන් පිළිතුරු ලියන්න.

'හෙට නිවාඩු දවසක් නේ. අපි කොළ කැඳ හදමු' අම්මා යෝජනා කළා. 'ඒක හොඳ අදහසක් අපි හැමෝම එකතු වෙලා කොළ කැඳ හදමු' තාත්තා කිව්වා. 'අපි කොළ කැඳට දමන කොළ ජාති මොනවා ද?' දුව ඇසුවා. 'ගොටුකොළයි, හාතාවාරියයි, ඉරමුසුයි දමමු' අම්මා කිව්වා. 'පොල්පලාත් දමමු' තාත්තා කිව්වා. 'තව මොනව ද අම්මේ ඕනෑ' 'කැකුළු හාලුයි, පොල් කිරියි, ලුණුයි.' 'මම හරි ආසයි කොළ කැඳ බොන්න' පුතා කිව්වා.

1. කොළ කැඳ සෑදීමට යෝජනා කළේ කවු ද ?

   ...............................................................................................................................................

2. මේ අය කොළ කැඳට දමන කොළ ජාති මොනවා ද ?

   ...............................................................................................................................................

3. පොල්පලා දැමීමට යෝජනා කළේ කවු ද ?

   ...............................................................................................................................................

4. පුතා බොන්න ආසයි කීවේ මොනවා ද ?

   ...............................................................................................................................................

# පින්තූර බලා පවසන දෙයට සවන් දීම

- දවසේ සිදුවීම් ප්‍රකාශ වන පින්තූර කිහිපයක් පහත දැක්වේ. සිසුන් කණ්ඩායම් වී පින්තූර පිළිබඳ ව කතා කරන්න. (එක් පින්තූරයක් පිළිබඳ ව කතා කළ යුත්තේ එක් කණ්ඩායමක් පමණි.)




.................................................................................................................................................




.................................................................................................................................................

# කතන්දරවලට සවන් දීම



- එළිමහන් ක්‍රියාකාරකමකි.
  - ✓ සිසුන් අඩ කවයක් ආකාරයට වාඩි වන්න.
  - ✓ පහත සඳහන් 'තාරා පැටියා' කතන්දරයට සවන් දෙන්න.
  - ✓ කතන්දරය ඇසුරෙන් අසන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු ලබා දෙන්න.
  - ✓ මෙලෙස තවත් කතන්දරවලට සවන් දී අසන ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙන්න. උදා :
    - ❖ සීසෑමේ පණිවිඩය අන්දරේ හරකුන්ට කියූ හැටි
    - ❖ කියවීම් පොතේ ඇතුළත් කතා

# තාරා පැටියා

තාරා පවුලක තාරා අම්මයි, තාරා තාත්තයි, තාරා පැටවු හතර දෙනෙකුයි සිටියා. පුංචි තාරා පැටවු එහා මෙහා යන කොට හරි ම ලස්සන යි. තාරා පැටවුන්ට පීනන්න ලස්සන විලක් තිබුණා. විලේ මල් පිපිලා. මාළු රංචු පීනනවා. තාරා අම්මා පැටවු එක්ක විලේ පීනන්න ගියා. එක තාරා පැටියෙක් විලට බහින්න අකමැති යි. 'එන්න පැටියෝ, බය වෙන්න එපා. මේ අනිත් අය පීනන්නේ.' තාරා අම්මා කිවුවා. 'අනේ, මට බැහැ. මට බයයි.' තාරා පැටියා අඬන්න පටන් ගත්තා. තාරා අම්මා හරි අමාරුවෙන් පැටියා විලට ගත්තා. 'සීතල යි, සීතල යි, අනේ මට සීතල යි' කියා කෑගසමින් පැටියා ගොඩට ආවා. අනිත් පැටවු සතුටින් පීනුවා. තාරා පැටවු හවස් වෙලා අම්මත් එක්ක ගෙදර ගියා. විලට බහින්න බයවුණු තාරා පැටියා අඬඅඬා නිදා ගත්තා. තාරා අම්මා නින්දට ගියේ හෙට නම් කොහොම හරි පැටියට පීනන්න පුරුදු කරන්න ඕනෑ කියලා හිතාගෙන.

තාරා අම්මා උදෙන් ම අවදි වුණා. පැටියට කතා කළා. 'පැටියෝ, ඇයි ඔයා වතුරට බය ? අද අපි දෙන්න ම පීනමු. අම්මත් එක්ක ඉන්න කොට බය වෙන්නේ මොකට ද?' කියලා අම්මා පැටියගේ හිත හැදුවා. තාරා අම්මා පැටියා තුරුල් කරගෙන, වතුරට බැස්සා. අම්මා පැටියත් එක්ක කතා කරකර පැටියා ළඟට ම වෙලා හිටියා. අම්මා පුංචි පැටියගෙ බය නැති කළා. දැන් මේ පුංචි තාරා පැටියට වතුරට තිබුණු බය නැති ව ගියා. සතුටින් පීනන්නට වුණා.

ඒ අතරේ අනෙක් පැටවු අවදි වුණා. පුංචි පැටියා, අම්මා එක්ක පීනනවා දැක්කා. හැමෝම කෑගසමින්, තටු සලමින්, විලට පැන්නා. පැටියා වට කරගෙන සෙල්ලම් කළා. ගොඩට වෙලා හිටපු තාරා තාත්තටත් හරි ම සතුටු යි. තාරා තාත්තත් විලට පැන්නා. හැමෝම එකතු වෙලා පීනපීනා සෙල්ලම් කළා. තාරා පවුලට ම එදා හරි ම සතුටු දවසක්.

1. තාරා පැටවුන්ට පීනන්න තිබුණේ කුමක් ද ?

.....................................................................................................................

2. තාරා පැටියා අඬන්න පටන් ගත්තේ ඇයි ?

.....................................................................................................................

3. තාරා පැටියට වතුරට තිබුණු බය නැති කළේ කවු ද ?

.....................................................................................................................


4. තාරා තාත්තට හරි ම සතුටු හිතුණේ ඇයි ?

.....................................................................................................................

# <u>පින්තූර කතාවලට සවන් දීම</u>

- ගුරුතුමා ප්‍රකාශ කරන කතාව අනුව අර්ථවත් කතාවක් ගොඩනැගෙන සේ පින්තූර අනුපිළිවෙළට ස්ථානගත කරන්න. කථාව ග්‍රහණය කරගෙන ගුරුතුමා වාචික ව අසන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු ලබා දෙන්න.

- <u>කතාව 01</u>




- <u>කතාව 02</u>



- කතාව 03



- කතාව 04



# පිළිතුරු



Answer

# 2 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_1$ $S_1$ ඉගෙනුම් පල

- ✓ පවසන දෙයට සවන් දීම
- ✓ පින්තූර බලා පවසන දෙයට සවන් දීම
- ✓ නිදහසේ කතා කිරීම
- ✓ පින්තූර බලා කතා කිරීම

- අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.
- පවසන දේ පිළිබඳ අවබෝධයෙන් යුතු ව සවන් දී ක්‍රියා කරයි.
- අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි.

## පවසන දෙයකට සවන් දීම

- පහත සඳහන් ඡේදයට සවන් දී ඡේදය ඇසුරෙන් පිළිතුරු ලියන්න.

'හෙට නිවාඩු දවසක් නේ. අපි කොළ කැඳ හදමු' අම්මා යෝජනා කළා. 'ඒක හොඳ අදහසක් අපි හැමෝම එකතු වෙලා කොළ කැඳ හදමු' තාත්තා කිවුවා. 'අපි කොළ කැඳට දමන කොළ ජාති මොනවා ද?' දුව ඇසුවා. 'ගොටුකොළයි, හාතාවාරියයි, ඉරමුසුයි දමමු' අම්මා කිවුවා. 'පොල්පලාත් දමමු' තාත්තා කිවුවා. 'තව මොනව ද අම්මේ ඕනෑ' 'කැකුළු හාලුයි, පොල් කිරියි, ලුණුයි.' 'මම හරි ආසයි කොළ කැඳ බොන්න' පුතා කිවුවා.

1. කොළ කැඳ සෑදීමට යෝජනා කළේ කවු ද ?

   ......අම්මා......

2. මේ අය කොළ කැඳට දමන කොළ ජාති මොනවා ද ?

   ......ගොටුකොළ, හාතාවාරිය, ඉරමුසු, පොල්පලා......

3. පොල්පලා දැමීමට යෝජනා කළේ කවු ද ?

   ......තාත්තා......

4. පුතා බොන්න ආසයි කීවේ මොනවා ද ?

   ......කොළ කැඳ......

## පින්තූර බලා පවසන දෙයට සවන් දීම

- දවසේ සිදුවීම් ප්‍රකාශ වන පින්තූර කිහිපයක් පහත දැක්වේ. සිසුන් කණ්ඩායම් වී පින්තූර පිළිබඳ ව කතා කරන්න. (එක් පින්තූරයක් පිළිබඳ ව කතා කළ යුත්තේ එක් කණ්ඩායමක් පමණි.)





..................උදෑසන..................................................සවස..........................





..................රාත්‍රිය..................................වැසි අවස්ථාවක්..........

## කතන්දරවලට සවන් දීම



- එළිමහන් ක්‍රියාකාරකමකි.
  - ✓ සිසුන් අඩ කවයක් ආකාරයට වාඩි වන්න.
  - ✓ පහත සඳහන් 'තාරා පැටියා' කතන්දරයට සවන් දෙන්න.
  - ✓ කතන්දරය ඇසුරෙන් අසන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු ලබා දෙන්න.
  - ✓ මෙලෙස තවත් කතන්දරවලට සවන් දී අසන ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙන්න. උදා :
    - ❖ සීසෑමේ පණිවිඩය අන්දරේ හරකුන්ට කියූ හැටි
    - ❖ කියවීම් පොතේ ඇතුළත් කතා

# තාරා පැටියා

තාරා පවුලක තාරා අම්මයි, තාරා තාත්තයි, තාරා පැටවු හතර දෙනෙකුයි සිටියා. පුංචි තාරා පැටවු එහා මෙහා යන කොට හරි ම ලස්සන යි. තාරා පැටවුන්ට පීනන්න ලස්සන විලක් තිබුණා. විලේ මල් පිපිලා. මාළු රංචු පීනනවා. තාරා අම්මා පැටවු එක්ක විලේ පීනන්න ගියා. එක තාරා පැටියෙක් විලට බහින්න අකමැති යි. 'එන්න පැටියෝ, බය වෙන්න එපා. මේ අනිත් අය පීනන්නේ.' තාරා අම්මා කිව්වා. 'අනේ, මට බැහැ. මට බයයි.' තාරා පැටියා අඬන්න පටන් ගත්තා. තාරා අම්මා හරි අමාරුවෙන් පැටියා විලට ගත්තා. 'සීතල යි, සීතල යි, අනේ මට සීතල යි' කියා කෑගසමින් පැටියා ගොඩට ආවා. අනිත් පැටවු සතුටින් පීනුවා. තාරා පැටවු හවස් වෙලා අම්මත් එක්ක ගෙදර ගියා. විලට බහින්න බයවුණු තාරා පැටියා අඬඅඬා නිදා ගත්තා. තාරා අම්මා නින්දට ගියේ හෙට නම් කොහොම හරි පැටියට පීනන්න පුරුදු කරන්න ඕනෑ කියලා හිතාගෙන.

තාරා අම්මා උදෙන් ම අවදි වුණා. පැටියට කතා කළා. 'පැටියෝ, ඇයි ඔයා වතුරට බය ? අද අපි දෙන්න ම පීනමු. අම්මත් එක්ක ඉන්න කොට බය වෙන්නේ මොකට ද?' කියලා අම්මා පැටියගේ හිත හැදුවා. තාරා අම්මා පැටියා තුරුල් කරගෙන, වතුරට බැස්සා. අම්මා පැටියත් එක්ක කතා කරකර පැටියා ළඟට ම වෙලා හිටියා. අම්මා පුංචි පැටියගෙ බය නැති කළා. දැන් මේ පුංචි තාරා පැටියට වතුරට තිබුණු බය නැති ව ගියා. සතුටින් පීනන්නට වුණා.

ඒ අතරේ අනෙක් පැටවු අවදි වුණා. පුංචි පැටියා, අම්මා එක්ක පීනනවා දැක්කා. හැමෝම කෑගසමින්, තටු සලමින්, විලට පැන්නා. පැටියා වට කරගෙන සෙල්ලම් කළා. ගොඩට වෙලා හිටපු තාරා තාත්තටත් හරි ම සතුටු යි. තාරා තාත්තත් විලට පැන්නා. හැමෝම එකතු වෙලා පීනපීනා සෙල්ලම් කළා. තාරා පවුලට ම එදා හරි ම සතුටු දවසක්.

1. තාරා පැටවුන්ට පීනන්න තිබුණේ කුමක් ද ?

   ලස්සන විලක් ..................................................................

2. තාරා පැටියා අඬන්න පටන් ගත්තේ ඇයි ?

   පීනන්න බැහැ කියලා ..................................................................

3. තාරා පැටියට වතුරට තිබුණු බය නැති කළේ කවු ද ?

   තාරා අම්මා ..................................................................


4. තාරා තාත්තට හරි ම සතුටු හිතුණේ ඇයි ?

   තාරා පැටියා පීනනවා දැක්ක නිසා ..................................................................

# පින්තූර කතාවලට සවන් දීම

- ගුරුතුමා ප්‍රකාශ කරන කතාව අනුව අර්ථවත් කතාවක් ගොඩනැගෙන සේ පින්තූර අනුපිළිවෙළට ස්ථානගත කරන්න. කථාව ග්‍රහණය කරගෙන ගුරුතුමා වාචික ව අසන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු ලබා දෙන්න.

- කතාව 01




- කතාව 02



- කතාව 03



- කතාව 04



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3in1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ